# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/32 - 2012 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

5 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ, 2012 මැයි මස 09 වැනි දින අංක 1757/4 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් අවසන්වරට සංශෝධිත 2006 ඔක්තෝබර් මස 05 වැනි දින අංක 1465/20 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙහි උපලේඛනයේ 28 වැනි අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන නව අයිතම එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

උපලේඛනය

"29. - සමාගම් දෙකෙහිම හිමිකම ශ්‍රී ලංකා රජය සතුවන අවස්ථාවකදී, සමාගමක් විසින් තවත් සමාගමකට, හෝ

- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකා රජය සතු සමාගමකට

මූලික නිකුතුවේදී ලබා දෙන කොටස් සහතිකය."

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

10-831

13A - G 16710— 860 (2012/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.